(85)
(36)

# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
**Ministry of Finance, Economic Stabilaization & National Policies**

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023. 04. 10 |

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත,

**<u>සුබසාධක ප්‍රතිලාභ ගෙවීම ලැබීම පිණිස සුදුසු තැනැත්තන් / පවුල් හඳුනා ගැනීම - 2022 වැඩසටහන යටතේ සංගණනය කළ ගෘහ ඒකක/ තැනැත්තන් හා ලියාපදිංචි අයදුම්පත් සංඛ්‍යාව අතර පවතින වෙනසට හේතු සහ ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග</u>**

ඔබද දන්නා පරිදි ඒකාබද්ධ සුබසාධක ප්‍රතිලාභ තොරතුරු කළමනාකරණ පද්ධතිය තුළ දත්ත ඇතුළත් කිරීමේ දී පැවති ගැටළු විසඳාගනිමින් සුබසාධක ප්‍රතිලාභ හිමි තැනැත්තන් තෝරාගැනීමේ ක්‍රියාවලියෙහි ඉදිරි පියවරයන් කඩිනමින් අවසන් කිරීමට අවස්ථාව ලැබී තිබේ. එහිදී සංගණනය කළ ගෘහ ඒකක/ තැනැත්තන් හා ලියාපදිංචි අයදුම්පත් සංඛ්‍යාව අතර පවතින වෙනසට හේතු සහ ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ පහත උපදෙස් ලබාදීමට කැමැත්තෙමි. මීට අමතරව පැන නැගෙන ගැටළු වේ නම් ඒවා තේරීම් කමිටුවේ සාකච්ඡාවට ගෙන තීරණය කළ හැකි බව වැඩිදුරටත් දන්වමි.

**1. ද්විත්ව අයදුම්පත්**

මෙය සිදුවිය හැකි අවස්ථාවන් දෙකක් හඳුනාගෙන ඇත.

අ) එක් පවුලකින් එක් අයදුම්පතකට වඩා වැඩි සංඛ්‍යාවක් යොමු කර තිබීම - මෙලෙස ද්විත්ව අයදුම්පත් යොමු කර ඇති අවස්ථාවකදී ක්ෂේත්‍ර සමීක්ෂණය යටතේ දත්ත රැස් කරන විට සිදු කරනු ලබන නිරීක්ෂණයන්ට අනුකූල වන ලෙස එම අයදුම්පත් සියල්ලම එක් අයදුම්පතකට ඒකාබද්ධ කිරීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා අදාළ වන පහසුකම ජංගම මෘදුකාංග යෙදවුම මගින් ලබා දී ඇත. (අයදුම්කරුගෙන් ඔබ විසින් එක් අයදුම්පතකට වඩා වැඩි සංඛ්‍යාවක් අයදුම්පත් යොමුකර පවතීද යන ප්‍රශ්නය අසා "ඔව්" යන පිළිතුර ලබාගෙන ඉදිරියට ගොස් දත්ත රැස් කිරීම අවසන් කිරීමෙන් පසුව එක් එක් අයදුම්කරුට ලබාදුන් QR කේතය Scan කිරීමෙන් සියළු අයදුම්පත් ඒකාබද්ධ කිරීමේ පහසුකම දැනටමත් සලසා ඇත).

ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අයදුම්පත්වල සඳහන් දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේදී සිදු විය හැකි අත්වැරදීම්/ මඟහැරීම් නිසා ද්විත්ව අයදුම්පත් පැවතිය හැකිය. මෙම තත්ත්වය වැළැක්වීම සඳහා පද්ධතියට දත්ත ඇතුළත් කිරීමෙන් පසු ඒවායේ සංශෝධනයන් කිරීමට පද්ධතිය මගින් ඒ සඳහා අවශ්‍ය වන පහසුකම ලබා දෙන ලදී. නමුත් එවැනි අත්වැරදීම්/ මඟහැරීම් තවදුරටත් පවතී නම්, පද්ධතියේ දැනට පවතින පහසුකම මගින් එය හුදෙක් ද්විත්ව අයදුම්පතක් පමණක් බවට සටහන් කර එය ද්විත්ව ගණනය වීම වැළැක්විය හැකිය.

**2. අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු අයදුම්කරු මිය යාම**

අ) මෙවැනි අවස්ථාවකදී අයදුම්කරු මියගියද එම පවුලේ වෙනත් සාමාජිකයින් සිටීනම් අවශ්‍ය දත්ත ලබාදෙනු ලබන්නේ එම පුද්ගලයෙකු වුවද දත්ත රැස්කිරීමේ කාර්යය ඉදිරියටත් සිදු කළ හැකිය. දත්ත ලබාදෙනු ලබන්නේ කවුරුන්ද යන්න සටහන් කිරීමට ජංගම මෘදුකාංග යෙදවුම මගින් අවස්ථාව ලබා දී ඇත.

ආ) අයදුම්කරු මියගිය අවස්ථාවකදී එම පවුලේ වෙනත් සාමාජිකයන් ද නොසිටීනම් තවදුරටත් දත්ත රැස්කිරීමේ කාර්යය සිදු කළ නොහැකිය. දත්ත පද්ධතිය තුළ එවැනි අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ පහසුකම

කාර්යාලය / அலுவலகம் / Office } Tel: 009411- 2151481 / 009411- 2484600/4117 / Fax: 009411- 2151482
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail } welfarebenefitboard2016@gmail.com / info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website } www.wbb.gov.lk

(application status modification) සලසා දී ඇති ස්ථානයෙන් එම අයදුම්පත් පිළිබඳව සටහනක් යෙදිය හැක (death of the applicant). මෙම අයදුම්පත්වලට අදාළ QR කේතයන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම තබාගත යුතුය.

**3. අයදුම්කරු අයදුම්පතෙහි සඳහන් කර ඇති ලිපිනයෙන් පදිංචිය හැරයාම**

අයදුම්කරුගේ පදිංචිය හැරයාම සම්බන්ධව අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාගේ තහවුරු කිරීමකින් පසුව එවැනි අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ හැකියාව (application status modification) දත්ත පද්ධතිය තුළින් ලබා දී ඇත. මෙම අයදුම්පත් වලට අදාළ QR කේතයන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම තබාගත යුතුය.

**4. අයදුම්කරු විදේශගත වීම**

අ) මෙහිදී අයදුම්කරු විදේශගත වුවද එම පවුලේ වෙනත් සාමාජිකයන් සිටීනම් අවශ්‍ය දත්ත ලබාදෙනු ලබන්නේ එම පුද්ගලයෙකු වුවද දත්ත රැස්කිරීමේ කාර්යය ඉදිරියටත් සිදු කළ හැකිය. දත්ත ලබාදෙනු ලබන්නේ කවුරුන්ද යන්න සටහන් කිරීමට ජංගම මෘදුකාංග යෙදවුම මගින් අවස්ථාව ලබා දී ඇත.

ආ) මෙහිදී අයදුම්කරු විදේශගත වූ අවස්ථාවකදී එම පවුලේ වෙනත් සාමාජිකයින් නොසිටීනම් තවදුරටත් දත්ත රැස්කිරීමේ කාර්යය සිදු කළ නොහැකිය. එවැනි අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ පහසුකම (application status modification) දත්ත පද්ධතිය තුළින් සලසා ඇති අතර එම ස්ථානයෙන් ඒ පිළිබඳව සටහනක් යෙදිය හැකිය (applicant gone overseas). එම අයදුම්පත්වලට අදාළ QR කේතයන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම තබාගත යුතුය.

**5. පන්සල්, වැඩිහිටි නිවාස සහ ළමා නිවාස වලින් ලද අයදුම්පත් වල දත්ත රැස් කිරීම**

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, ජංගම මෘදුකාංග යෙදවුම මගින් උපමාන 22 ක් පදනම් කරගෙන සිදු කරනු ලබන ක්ෂේත්‍ර දත්ත රැස් කිරීමේ කාර්යයයේදී මෙවන් සුවිශේෂී තත්ත්වයන් යටතේ නිවැරදිව දත්ත සත්‍යාපනය කල නොහැකි බවට හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් මෙම වැඩසටහන යටතේ කටයුතු නොකිරීමට අදාළව ප්‍රතිපත්තිමය තීරණයකට එළඹ ඇත. එවැනි අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ පහසුකම (application status modification) දත්ත පද්ධතිය තුළින් සලසා ඇති අතර එම ස්ථානයෙන් ඒ පිළිබඳව සටහනක් යෙදිය හැකිය. මෙම අයදුම්පත්වලට අදාළ QR කේතයන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම තබාගත යුතුය.

**6. අයදුම්කරු අයදුම්පතට අදාළ දත්ත සත්‍යාපනය කිරීම ප්‍රතික්ෂේප කිරීම**

මෙවැනි අයදුම්පත් සම්බන්ධයෙන් දත්ත සත්‍යාපනය කිරීමේ අවශ්‍යතාවයක් නොමැති අතර එවැනි අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ පහසුකම (application status modification) දත්ත පද්ධතිය තුළින් සලසා ඇත.

**7. අයදුම්කරු අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු සිරගතවීම**

අ) මෙහිදී අයදුම්කරු අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු සිරගත වුවද එම පවුලේ වෙනත් සාමාජිකයින් සිටීනම් අවශ්‍ය දත්ත ලබාදෙනු ලබන්නේ එම පුද්ගලයෙකු වුවද දත්ත රැස්කිරීමේ කාර්යය ඉදිරියටත් සිදු කළ හැකිය. දත්ත ලබාදෙනු ලබන්නේ කවුරුන්ද යන්න සටහන් කිරීමට ජංගම මෘදුකාංග යෙදවුම මගින් අවස්ථාව ලබා දී ඇත.

ආ) මෙහිදී අයදුම්කරු අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු සිරගත වුවද එම පවුලේ වෙනත් සාමාජිකයින් නොසිටීනම් එවන් අවස්ථාවකදී තවදුරටත් දත්ත රැස්කිරීමේ කාර්යය සිදු කළ නොහැකිය. එවැනි අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ පහසුකම (application status modification) දත්ත පද්ධතිය තුළින් සලසා ඇති අතර එම ස්ථානයෙන් මේ සම්බන්ධව සටහනක් යෙදිය හැකිය (applicant in prison). මෙම අයදුම්පත්වලට අදාළ QR කේතයන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම තබාගත යුතුය. අයදුම්කරු නිදහස් වීමෙන් පසුව අදාළ දත්ත සත්‍යාපනය කළ හැකිය.

**8. අයදුම්කරු දත්ත සමීක්ෂණය කරනු ලබන දිනයේ නිවසේ නොසිටීම**
අයදුම්කරු නිවසේ රැඳී සිටින අවස්ථාවක් විමසා නැවත නිවසට ගොස් අදාළ දත්ත සත්‍යාපනය කළ යුතුය.

**9. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිනය සොයාගත නොහැකි වීම**
මේ සම්බන්ධව අදාළ ප්‍රාදේශිය ලේකම්වරයාගේ තහවුරු කිරීමකින් පසුව එවැනි අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ හැකියාව (application status modification) දත්ත පද්ධතිය තුළින් ලබා දී ඇත.

**10. අයදුම්කරු වෙනත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට පදිංචියට යාම**
අදාළ ප්‍රාදේශිය ලේකම්වරයාගේ තහවුරු කිරීමකින් පසුව මෙවැනි අයදුම්පත්වල දත්ත පද්ධතිය තුළින්ම අයදුම්කරු පදිංචිව සිටින නව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට මාරු කිරීමේ පහසුකම ප්‍රාදේශිය ලේකම්වරයාට ලබාදීමට සූදානම් කර ඇත. ඒ අනුව අදාළ ප්‍රාදේශිය ලේකම්වරුන් දෙදෙනා අතර මේ සම්බන්ධයෙන් මනා සන්නිවේදනයක් ද සිදුවිය යුතුය.

**11. අයදුම්කරු දත්ත සත්‍යාපනය කිරීම සිදුකරන අවස්ථාවේ අදාළ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම**
මෙවැනි අයදුම්පත් සම්බන්ධයෙන් දත්ත සත්‍යාපනය කිරීමේ අවශ්‍යතාවයක් නොමැති අතර මෙම අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ පහසුකම (application status modification) දත්ත පද්ධතිය තුළින් සලසා ඇත. මෙම අයදුම්පත්වලට අදාළ QR කේතයන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම තබාගත යුතුය.

**12. අයදුම්කරු දැනට සිටින ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේම වෙනත් ග්‍රාම නිලධාරී වසමක පදිංචියට යාම**
මූලික දත්ත ඇතුලත් කළ පද්ධතිය තුළ වසම් මාරු කිරීමේ පහසුකම දැනටමත් සලසා ඇත. ඒ අනුව අදාළ ග්‍රාම නිලධාරී වසමේ නම සංශෝධනය කර අදාළ QR කේතය මුද්‍රණය කර දත්ත රැස්කිරීමේ කාර්යය සිදු කළ හැකිය.

**13. වෙනත් හේතු**
මෙවැනි අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ පහසුකම (application status modification) දත්ත පද්ධතිය තුළින් සලසා ඇති අතර එම ස්ථානයෙන් මේ සම්බන්ධයෙන් සටහනක් ද යෙදිය හැකිය (other).

**14. අයදුම්කරු අසනීප වී රෝහල් ගතවීම**
මෙවැනි අවස්ථාවන් දෙකක් හඳුනාගත හැකිය.

අ) මෙහිදී අයදුම්කරු රෝහල්ගත වුවද එම පවුලේ වෙනත් සාමාජිකයින් සිටීනම් අවශ්‍ය දත්ත ලබාදෙනු ලබන්නේ එම පුද්ගලයෙකු වුවද දත්ත රැස්කිරීමේ කාර්යය ඉදිරියටත් සිදු කළ හැකිය. දත්ත ලබාදෙනු ලබන්නේ කවුරුන්ද යන්න සටහන් කිරීමට ජංගම මෘදුකාංග යෙදවුම මඟින් අවස්ථාව ලබා දී ඇත.

ආ) මෙහිදී අයදුම්කරු රෝහල්ගත වුවද එම පවුලේ වෙනත් සාමාජිකයන් නොසිටීනම් එවන් අවස්ථාවකදී තවදුරටත් දත්ත රැස්කිරීමේ කාර්යය සිදු කළ නොහැකිය. එවැනි අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ පහසුකම (application status modification) දත්ත පද්ධතිය තුළින් සලසා ඇති අතර එම ස්ථානයෙන් මේ සම්බන්ධයෙන් සටහනක් යෙදිය හැකිය (applicant in hospital/ sick). එම අයදුම්පතට අදාළ QR කේතය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම තබාගත යුතුය.

**15. දැනට පදිංචි ලිපිනයෙන් තාවකාලිකව ඉවත්ව වෙනත් ස්ථානයක පදිංචි වී සිටීම**
අ) මෙහිදී අයදුම්කරු දත්ත රැස්කිරීමට යන අවස්ථාවේදී තාවකාලිකව එම ලිපිනයෙන් බැහැරව සිට නැවත පැමිණෙන්නේ නම් හා එම පවුලේ වෙනත් සාමාජිකයෙකු අවශ්‍ය දත්ත ලබාදෙන්නේ නම් දත්ත රැස්කිරීමේ

කාර්යය ඉදිරියටත් සිදු කළ හැකිය. දත්ත ලබාදෙනු ලබන්නේ කවුරුන්ද යන්න සටහන් කිරීමට ජංගම මෘදුකාංග යෙදවුම මඟින් අවස්ථාව ලබා දී ඇත.

ආ) මෙහිදී අයදුම්කරු ස්ථිර පදිංචි ලිපිනයෙන් තාවකාලිකව ඉවත්ව වෙනත් ස්ථානයක පදිංචිව සිටින අවස්ථාවකදී එම පවුලේ වෙනත් සාමාජිකයන් නොසිටීනම් එවැනි විටකදී තවදුරටත් දත්ත රැස්කිරීමේ කාර්යය සිදු කළ නොහැකිය. එවැනි අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ පහසුකම (application status modification) දත්ත පද්ධතිය තුළින් සලසා ඇති අතර එම ස්ථානයෙන් මේ සම්බන්ධයෙන් සටහනක් යෙදිය හැකිය (moved from current location). මෙවන් අයදුම්පත්වලට අදාළ QR කේතයන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම තබාගත යුතුය.

**16. වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත් අයදුම්පත්**

අ) දත්ත රැස්කිරීමේදී පරිපාලන මායිම්වල පිහිටි නිවාස සම්බන්ධයෙන් මෙවැනි වැරදීම් සිදුවිය හැකිය. මෙවැනි අයදුම්පත්වල දත්ත පද්ධතිය මඟින්ම වෙනස් කිරීමේ පහසුකම සලසා ඇත. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ ග්‍රාම නිලධාරී වසම වෙනස් කළ හැකිය.එවැනි අයදුම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ පහසුකම (application status modification) දත්ත පද්ධතිය තුළින් සලසා ඇති අතර එම ස්ථානයෙන් මේ සම්බන්ධයෙන් සටහනක් යෙදිය හැකිය (application address modification).

ආ) වෙනත් දිස්ත්‍රික්කයට අයත් අයදුම්පතක් නම් ප්‍රාදේශීය ලේකම්වරයාගේ ලිපියකින් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත දත්වා එය වෙනස් කළ හැකිය.

මෙම අවසථාවන් 02 යටතේදීම එක් දිස්ත්‍රික්/ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් සතුව පැවති අයදුම්පත් සංඛ්‍යාවට එකක් අඩුවීමක් හෝ තවත් දිස්ත්‍රික්/ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් සතුව පවතින අයදුම්පත් සංඛ්‍යාවට එකක් වැඩිවීමක් සිදුවේ.

බී. විජයරත්න
සභාපති / කොමසාරිස්

පිටපත -
සියළු දිසාපත්වරුන් වෙත - කාරු.දැ.ගැ.ස.